# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

ඒ. එන්.කියු.වී. ප්‍රනාන්දු,
101/4, ගුවන්වත්ත
පහළ කදිරාණ,
තිඹිරිගස්කටුව

**අභියාචක**

**අභියාචනා අංකය : 460/2021** **එදිරිව**

ලංකා බැංකුව
කොළඹ 01

**පොදු අධිකාරිය**

**ඉදිරිපිටදී** : 1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක සිටී.
පොදු අධිකාරිය වෙනුවෙන් සූම් තාක්ෂණය ඔස්සේ සහකාර කළමණාකාර ජනරාල් ඩබ්.ඒ.ජී.එල් වීරක්කොඩි (තොරතුරු නිලධාරි), ජ්‍යෙෂ්ඨ නීති නිලධාරි දයාජිනී පීරිස් මිය සහ සහකාර කළමණාකාරිනි ආර්.ආර්.එච්.ටී රත්නායක මිය පෙනී සිටී.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - ඉදිරිපත් කර නැත.
පොදු අධිකාරිය - 2022.04.27

**විභාග කළ දිනය** : 2022.05.05

**තීරණය කළ දිනය** : 2022.05.05

**කොමිෂන් සභාවේ තීරණය:**

**අභියාචනයට පසුබිම්වූ කරුණු**

අභියාචක විසින් 2020.10.05 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

> *"මේ වන විට ලංකා බැංකුව හිඟ තබා ගිය විදුලි බිල්පත් මුදල මා විසින් ගෙවා අවුරුද්දකුත් මාස අටක (අවු. 01 මාස 08ක) කාලයක් ඉක්ම ඇති බව පෙන්වා දෙමින්, කුමන හේතුවක් මත මට හිමි මුදල් නොගේවමින් එසේ නිහඬව සිටින්නේද යන්න දැනුම් දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි."*

තොරතුරු නිලධාරි 2020.11.16 දිනැතිව පිළිතුරු සපයමින් ප්‍රකාශ කර සිටින්නේ,

*"ඔබ විසින් තොරතුරු නිලධාරී වෙත යොමුකළ 2020 ඔක්තෝම්බර් 05 දිනැති තොරතුරු ඉල්ලීම, පෞද්ගලික පාශර්වයක් සමඟ බැංකුව ඇති කරගත් ගිවිසුමකට අදාළ තොරතුරු වන බැවින්, පනතේ 5 වන උපවගන්තියේ විධිවිධාන අනුව පහත සඳහන් කර ඇති හේතු මත ප්‍රතික්ෂේප කරන ලද බව මෙයින් දන්වා සිටිමු.*

1. *2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනතෙහි අංක 5 (1) (අ) වගන්තිය."* යනුවෙනි.

මෙයින් අතෘප්තියට පත් අභියාචක විසින් 2020.12.03 දිනැතිව නම්කළ නිලධාරි වෙත අභියාචනයක් යොමු කර ඇත.

නම්කළ නිලධාරි 2020.12.14 දිනැතිව පිළිතුරු සපයමින්,

*" තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් තොරතුරු නිලධාරී විසින් ලබා දුන් පිළිතුර සමඟ එකඟ වන බව දන්වා සිටින අතර ඔබගේ අභියාචන ඉල්ලීම සපුරාලිය නොහැකි බව"* දන්වා ඇත.

මෙයින් අතෘප්තියට පත් අභියාචක විසින් 2021.02.18 කොමිෂන් සභාව වෙත ඉහත අංක දරණ අභියාචනය යොමු කර ඇත.

පොදු අධිකාරිය විසින් 2022.04.27 දිනැතිව, කොමිෂන් සභාව වෙත ලිඛිත කරුණු දැක්වීමක් සිදු කරමින් පහත පරිදි කරුණු දක්වා ඇත.

*" ඒ.එන්.කිව්.වී. ප්‍රනාන්දු මහතා ඔහුගේ තොරතුරු ඉල්ලීම මඟින් විමසා සිටියේ, ලංකා බැංකුව දෙමන්හන්දිය ශාඛාව 2018 ඔක්තෝම්බර් මාසයේදී නව ශාඛා පරිශ්‍රයට පිවිසීමක් සමඟ ඊට පෙර ස්ථානගතව පැවති පරිශ්‍රයේ බැංකුව සතු තිබූ දේපළ සම්පූර්ණයෙන් ඉවත්කර ගන්නා තෙක් පැරණි පරිශ්‍රය භාවිතා කිරීමේදී එහි විදුලිය පාරිභෝජනය කිරීම වෙනුවෙන් අදාළ රු. 7,140.70 ක මුදල සහ ඒ සම්බන්ධයෙන් වන රු. 82.83 ක දඩ මුදල නොගෙවා සිටින්නේ කුමන හේතුවක් මතද යන්න ප්‍රනාන්දු මහතා වෙත දැනුම් දෙන ලෙසයි.*

*ඒ සම්බන්ධයෙන් තොරතුරු සොයා බැලීමේදී අනාවරණය වූයේ, ලංකා බැංකුව දෙමන්හන්දිය ශාඛාව පෙර ස්ථානගතව පැවති ස්ථානයට අදාළ බදු ගිවිසුම සකසා ඇත්තේ ඩබ්ලිව්.පී.ඒ.ටී. ප්‍රනාන්දු මහත්මිය සමඟ වන අතර මෙම තොරතුරු ඉල්ලා සිටින ඒ.එන්.කිව්.වී. ප්‍රනාන්දු මහතා සමඟ එම ගිවිසුම ප්‍රකාරව හෝ වෙනත් කිසියම් ගිවිසුමක් ප්‍රකාරව කිසිදු සම්බන්ධයක් නොමැති බවයි.*

*ඒ අනුව අදාළ තොරතුරු ඉල්ලීම පෞද්ගලික පාශර්වයක්සමඟ බැංකුව ඇති කරගත් ගිවිසුමකට අදාල වන බැවින්, එම තොරතුරු ලබා දීම 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනතේ 5.1 (අ) වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරන ලදී.*

*එසේම, ලංකා බැංකුව දෙමන්හන්දිය ශාඛාව පෙර ස්ථානගතව පැවති ස්ථානයෙන් 2018 ඔක්තෝම්බර් මස තුලදීම සියලුම භාණ්ඩ හා උපකරණ නව පරිශ්‍රය වෙත ඉවත් කර ඇත. එසේම, 2018 ඔක්තෝබර් මස සඳහා විදුලි බිල්පත වන රු. 44,409/05 ක මුදල 2018 නොවැම්බර් මස 08 වන දින නියමිත පරිදි පියවා ඇති බව දන්වනු කැමැත්තෙමු.*

*ඉහත සඳහන් කරන ලද අංක 1 සිට 5 දක්වා වූ ඇමුණුම් ඔබගේ දැන ගැනීම පිණිස මේ සමඟ අමුණා එවමු."*

**සලකා බැලීම**

අද දින පරීක්ෂණයේදී හෙළිදරවු වූ අන්දමට තොරතුරු ඉල්ලීමේ දැක්වෙන කරුණු වලට අදාළ කිසිදු ගිවිසුමකට පොදු අධිකාරිය විසින් අභියාචක සමග එළඹී නොමැත. පොදු අධිකාරිය සඳහන් කළ අන්දමට ප්‍රනාන්දු මහත්මිය නැමති කාන්තාවක් සමග ගිවිසුම්ගතව සිට ඇති අතර අදාළ ගොඩනැගිල්ලේ ගිවිසුම් කාලයෙන් පසුව සිටි කාල සීමාව සඳහා මුදල්ද එකී ප්‍රනාන්දු මහත්මිය වෙත ගෙවා ඇත. පොදු අධිකාරියේ ස්ථාවරය වූයේ අභියාචකට එවැනි මුදලක් ගෙවීමට කරුණු කිසිවක් උදා වී නොමැති බවය. අභියාචකටද තම ස්ථාවරය පැහැදිලි කිරීමට නොහැකි විය. එබැවින් මෙම අභියාචනය අවසන් කිරීමට තීරණය කරමු.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය වෙත, තොරතුරු නිලධාරි වෙත සහ අභියාචක වෙත දන්වා යැවීමට කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරනු ලදී.